# 179 අප ගලවා ගැනුමට

අප ගලවා ගැනුමට මේ ලෝ වැඩි බව
සිරි සිරුරෙන්ම  අප පෝෂ්‍ය කෙරු බව
සියහි කර උදම් වෙමින් ඔබ පසසන්නෙමු
ජය ජය වේ තුති මංගල වේ//

සම්දුන් නිවහනේ එතුමන් පසසන්න
නිල්වන්  තුඹ කුසෙහි එතුමන් පසසන්න
බලවත් ක්‍රියා සම්දුන්ගේ පසසන්න
තේජවත් මුනිගේ මහ'තුම් බව පසසන්න

හොරණෑවේ  මහ'ඩින් එතුමන් වනනූ
වීනාවේ තත් මැද ඒ ගුණ ගයනූ
රබන් නදට මුනිඳුන් පසසා නටනූ
තතින් තතට වයමින්  සුසිරය පිඹිනූ

මහ හඬ  නංවා අත්තාලම් ගසනූ
කිංකිණි හඬවා අත්තාලම් ගසනූ
හුස්ම තිබෙන මෙලෝ සතුනි  එකතු වෙනූ
විශ්ම ජනක මුනිඳුන් පැසසුම් කරනූ